"කොරෝනා පරීක්ෂාවට රෝහල් ගත කළ රැඳවියා 8 වැනි මහලෙන් පැන දිවි නසා ගනී" යන සිරස්තලයෙන් යුතුව දිවයින පුවත්පත මගින් පුවත් වාර්තාවක් දක්වා තිබිණි. ද අයිලන්ඩ් පුවත්පතද ඒ ආකාරයෙන්ම එම පුවත දක්වා තිබිණි.

කෙසේ වෙතත් ලංකාදීප, දිනමිණ සහ අරුණ පුවත්පත් මගින් මෙම පුවත දක්වා තිබුණේ "...රැඳවියෙක් අට වැනි මහලෙන් වැටී මරුට" යනුවෙනි. මෙම පුවත්පත් දෙකම සිදුවීම දිවි අහිමි කරගැනීමක් ලෙසින් දක්වා නොතිබුණි. මව්බිම පුවත්පතෙහි මෙම පුවත පළ වී නොතිබුණි.

මෙම පුවත් අතුරින් නිවැරදි ලෙසින් මූලාශ්‍ර දක්වමින් පුවත වාර්තා කොට තිබුණේ ලංකාදීප පමණි. අනෙකුත් පුවත් වාර්තාවන් තුළ මූලාශ්‍ර සඳහන්ව නොතිබුණි.

දිවයින සහ ද අයිලන්ඩ් විසින් මෙය දිවි අහිමි කරගැනීමක් ලෙසින් වාර්තා කරන්නේ නම්, ඒ සමග හදිසි උපකාරක අංකද සඳහන් කළ යුතුව තිබිණි. වඩාත් යෝග්‍ය මාධ්‍යකරණය එයයි.

කෙසේ නමුත් දිවයින සහ ද අයිලන්ඩ් මගින් මෙම සිදුවීම දිවි අහිමි කරගැනීමක් ලෙසින් වාර්තා කිරීමටත්, ලංකාදීප, දිනමිණ සහ අරුණ මගින් මෙය අනතුරක් ලෙසින් වාර්තා කිරීමටත් හේතුව කුමක්ද යන්න පාඨක අප ඇසිය යුතු පැනයයි. මෙම පුවත් වල පරස්පරතාවයට හේතුව කුමක්ද? ඒ සම්බන්ධයෙන් ඔබේ අදහස කුමක්ද?

#MediaEthicsSL #lka #SinhalaPress #EnglishPress #Mawbima #TheIsland #Divaina #Lankadeepa #Dinamina #Aruna